# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 9 දරන
# අල්ලස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 පෙබරවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 90 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1980 අංක 9 දරන අල්ලස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 53/76.

## අල්ලස් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1980 අංක 9 දරන අල්ලස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**26 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. 1958 අංක 40 දරන පනතින් ද, 1965 අංක 2 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් ද සංශෝධනය කරන ලද (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්ලස් පනතෙහි 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, යම් තැනැත්තකුට විරුද්ධව අල්ලස් චෝදනාවක් විමර්ශනය කරනු ලබන අතරතුර හෝ අල්ලස් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් ආරම්භ කිරීමෙන් පසුව හෝ අල්ලස් කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්—

(අ) (i) එම තැනැත්තා විසින් හෝ එම තැනැත්තාගේ භාර්යාව හෝ ස්වාමිපුරුෂයා, පුත්‍රයන් නැතහොත් දියණියන් විසින් හෝ ඕනෑම අවස්ථාවක නැතහොත් අල්ලස් කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන යම් අවස්ථාවක අයිතිය හෝ සන්තකය හෝ දරන ලද චංචල හෝ නිශ්චල සියලු දේපළ ප්‍රමාණය දක්වමින්, ඒ එක් එක් දේපළ ප්‍රමාණ මිලට ගැනීමෙන්, තෑගි වශයෙන් ලැබීමෙන්, පවරනු ලැබීමෙන්, උරුම වීමෙන් නැතහොත් අන්‍යාකාරයකින් අත්කර ගන්නා ලද දිනය නිශ්චිතව දක්වන්නා වූ;

(ii) අල්ලස් කොමසාරිස්වරයාගේ මතයට අනුව, විමර්ශනය සඳහා අදාළ වන්නා වූ වෙනත් කරුණු පිළිබඳ විස්තර අඩංගු වන්නා වූ

ලියවිල්ලකින් වූ දිවුරුම් ප්‍රකාශයක් සපයන ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය;

(ආ) (i) වෙනත් යම් තැනැත්තකු විසින් ඕනෑම අවස්ථාවක නැතහොත් අල්ලස් කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන යම් අවස්ථාවක අයිතිය හෝ සන්තකය හෝ

දරන ලද චංචල හෝ නිශ්චල සියලු දේපළ පිළිබඳ තොරතුරු විමර්ශනයට උපකාරී විය හැකි බවට සාධාරණ හේතු ඇතැයි අල්ලස් කොමසාරිස්වරයා විශ්වාස කරන අවස්ථාවක ඒ දේපළ ප්‍රමාණය දක්වන්නා වූ;

(ii) අල්ලස් කොමසාරිස්වරයාගේ මතයට අනුව, විමර්ශනය සඳහා අදාළ වන්නා වූ වෙනත් කරුණු පිළිබඳ විස්තර අඩංගු වන්නා වූ

ලියවිල්ලකින් වූ දිවුරුම් ප්‍රකාශයක් සපයන ලෙස ඒ වෙනත් යම් තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය;

(ඈ) එම තැනැත්තාගේ හෝ එම තැනැත්තාගේ භාර්යාවගේ හෝ ස්වාමි පුරුෂයාගේ හෝ එම තැනැත්තාගේ පුත්‍ර යකුගේ නැතහොත් දියණියකගේ හෝ ගිණුමට අදාළ සටහන් ඇතුළත් බැංකුවේ යම් පොතක්, ලේඛනයක් නැතහොත් චෙක් පතක්, දැන්වීමෙහි නිශ්චිත කාලය ඇතුළත ඉදිරිපත් කරන ලෙස හෝ එම සටහන්වල සහතික කරන ලද පිටපත් එසේ නිශ්චය කර ඇති ආකාරයට ඉදිරිපත් කරන ලෙස හෝ ශ්‍රී ලංකාවේ කිසියම් බැංකුවක කළමණාකාරවරයාට නියම කරනු ලැබිය හැකි ය;

(ඇ) එම තැනැත්තාගේ හෝ එම තැනැත්තාගේ භාර්යාවගේ හෝ ස්වාමි පුරුෂයාගේ හෝ එම තැනැත්තාගේ පුත්‍රය කුගේ නැතහොත් දියණියකගේ කටයුතුවලට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා ළඟ ඇති සියලු තොරතුරු, දැන්වීමෙහි නිශ්චිත ආකාරයට සපයන ලෙස ද, එම කොමසාරිස් ජනරාල්වරයා සන්තකයෙහි හෝ ඔහුගේ භාරය යටතේ පවත්නා, එම තැනැත්තාට, එම තැනැත්තාගේ භාර්යාවට හෝ ස්වාමි පුරුෂයාට, පුත්‍රයාට නැතහොත් දියණියට අදාළ කිසියම් ලේඛනයක් හෝ කිසියම් ලේඛනයක සහතික කරන ලද පිටපතක් හෝ එම දැන්වීමෙහි නිශ්චිත ආකාරයට ඉදිරිපත් කරන ලෙස නැත හොත් සපයන ලෙස එම කොමසාරිස් ජනරාල්වරයාට නියම කරනු ලැබිය හැකි ය;

(ඉ) තමාගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ තිබෙන කිසි යම් ලේඛනයක් හෝ කිසියම් ලේඛනයක සහතික කරන ලද පිටපතක් හෝ දැන්වීමෙහි නිශ්චිත ආකාරයට ඉදිරි පත් කරන ලෙස නැතහොත් සපයන ලෙස යම් දෙපාර්ත මේන්තුවක්, කාර්යාලයක් හෝ ආණ්ඩුවේ ආයතනයක් භාරව සිටින තැනැත්තාට හෝ කිසියම් පළාත් පාලන

ආයතනයක හෝ කිසියම් උපලේඛනගත ආයතනයක හෝ කිසියම් උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයක හෝ නගරාධිපතිවරයාට, සභාපතිවරයාට, පාලකවරයාට හෝ ප්‍රධාන විධායක නිලධරයාට හෝ නියම කරනු ලැබිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" මහාධිකරණය වෙත අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීම.

5. යම් තැනැත්තකුට විරුද්ධව අල්ලස් චෝදනාවක් පිළිබඳව විමර්ශනය කිරීමෙන් පසුව, මේ පනතේ II වන කොටසෙහි නිශ්චිත වරදක් ඒ තැනැත්තා විසින් කර ඇති බවට බැලූ බැල්මට පෙනී යන නඩුවක් ඇතැයි අල්ලස් කොමසාරිස්වරයා සෑහීමට පත් වෙයි නම්, සිය අත්සනින් සහතික කරන ලද එම විමර්ශන වාර්තාවෙහි පිටපතක් එම කොමසාරිස්වරයා විසින් නීතිපතිවරයා වෙත යැවිය යුතු අතර, නීතිපතිවරයා විසින් එම තැනැත්තාට විරුද්ධව මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද රුපියල් දෙසියයක් නො ඉක්මවන යම් මුදලක හෝ රුපියල් දෙසියයක් නො ඉක්මවන වටිනාකමක යම් තුටු පඬුරක් අයැදීමෙන්, භාර ගැනීමෙන් නැතහොත් පිරිනැමීමෙන් වරද සමන්විත වන අවස්ථාවක, අල්ලස් කොමසාරිස්වරයා විසින් වරදෙහි ස්වභාවය සහ වෙනත් කරුණු ගැන සැලකිලිමත් ව ඒ තැනැත්තාට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පවරනු ලැබිය හැකි අතර, ඒ අනුව, අල්ලස් කොමසාරිස්වරයා විසින් පවරන ලද යම් නඩු කටයුත්තක් විභාග කර තීරණය කිරීමේ අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණයට තිබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. 1965 අංක 2 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ වීම.

6. (1) (2) වන උපවගන්තිය මගින් අත් හරිනු ලැබ නොමැති නැතහොත් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, මේ පනත යටතේ වූ වැරදි සඳහා අධිකරණයක පවරනු ලබන නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තිය, මේ පනත යටතේ, මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු සඳහා අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියෙහි "තව ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 95 වන වගන්තියෙහි සිට 99 වන වගන්තිය (දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල" යන වචන වෙනුවට "තව ද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 68 වන වගන්තියෙහි සිට 76 වන වගන්තිය (දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. 1965 අංක 2 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"23අ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් අල්ලස් සඳහා වූ අධිචෝදනාවක් විභාග කිරීමට අධිකරණ බලය.

8. වෙනත් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, මේ පනතේ 23අ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් අල්ලස් සඳහා වූ අධිචෝදනාවක් විභාග කිරීමේ අධිකරණ බලය, ඕනෑම අධිකරණ කලාපයක පැවැත්වෙන මහාධිකරණයකට තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ඉවත් කිරීම.

7. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. 1958 අංක 40 දරන පනතින්, 1965 අංක 2 දරන පනතින්, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 11 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(ආ) ඒ නඩු විභාගය අවසාන වූ පසු, අධිකරණ කටයුත්තක යම් අවස්ථාවක දී සිතා මතා බොරු සාක්ෂි දීම පිළිබඳ ව ඒ සාක්ෂිකරු ඒ අධිකරණය ඉදිරියේ චෝදනාවක් මත, නඩු විභාග කිරීම ද, එම අධිකරණය මහාධිකරණය නම්, ඒ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පිළියෙල කොට අත්සන් තබන ලද අධිචෝදනාවක් මත විනිශ්චය සඳහා ඉදිරිපත් කරවා නඩු විභාග කිරීම ද;".

**9.** 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) "දිසා අධිකරණයක් ඉදිරියෙහි අල්ලස් සඳහා අධිචෝදනා ලැබූ තැනැත්තකුගේ" යන වචන වෙනුවට "මේ පනත යටතේ වරදක් සඳහා වූ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) "අධිචෝදනා පත්‍රයෙහි" යන වචන වෙනුවට "සාක්ෂිකරුවන්ගේ නැතහොත් ඉදිරිපත් කිරීම්වල නාම ලේඛනයෙහි" යන වචන ආදේශ කිරීමෙන්.

**10.** 1958 අංක 40 දරන පනතින් සහ 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) "අපරාධ නඩු විධාන සංග්‍රහය" යන යෙදුම වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ii) "දිසා අධිකරණයක" යන යෙදුම වෙනුවට "අධිකරණයක" යන යෙදුම ආදේශ කිරීමෙන්.

**11.** 1958 අංක 40 දරන පනතින්, 1965 අංක 2 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) "රාජ්‍ය නිලධරයා" යන යෙදුම යෙදෙන සෑම ස්ථානයක වුව ද ඒ වෙනුවට "රජයේ සේවකයා" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ii) අතුරු වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

"එසේම තවදුරටත් රජයේ සේවකයකු වන වෛද්‍ය වෘත්තිකයකුට කිසියම් තුටු පඬුරක් අයැදීමට හෝ භාර ගැනීමට වෛද්‍ය ආඥාපනතේ 35 වන වගන්තියෙන් හිමිකම නොතිබිය යුතු ය.".

**12.** 1965 අංක 2 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ (1958 අංක 40 දරන පනතින් ඇතුළත් කරන ලද) 23අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(6) මේ වගන්තිය යටතේ වරදක් සඳහා යම් නඩු පැවරීමක දී යම් නිශ්චල දේපළක වටිනාකම හෝ ඒ දේපළ මත යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ පිරිවැය සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගෙන් සහතිකයක්, ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන්නේ නම් මිස සහ එසේ කරනු ලබන තෙක්, ඒ වටිනාකම සහ ඉදි කිරීමේ පිරිවැය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි විය යුතු ය.

මේ උපවගන්තියෙහි "ප්‍රධාන තක්සේරුකරු" යන්නෙන් ආණ්ඩුවේ ප්‍රධාන තක්සේරුකරු අදහස් වන අතර ඊට ආණ්ඩුවේ තක්සේරු දෙපාර්තමේන්තුවේ යම් ජ්‍යෙෂ්ඨ සහකාර තක්සේරුකරුවෙක් හෝ සහකාර තක්සේරුකරුවෙක් ඇතුළත් වේ.'.

(ii) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

'(7) මේ වගන්තියෙහි කාර්යයන් සඳහා "තැනැත්තකු" යන්නෙන්, 18 වන වගන්තියෙහි හෝ 20 වන වගන්තියෙහි සඳහන් කිසියම් ක්‍රියාවකට එම තැනැත්තාගේ සම්බන්ධතාවක් ඇතැයි දැක්විය හැකි වුව ද නොවුව ද, මේ පනතේ අර්ථානුකූලව ඔහු රජයේ සේවකයකු වුව ද නොවුව ද කවර වූ හෝ යම් තැනැත්තකු අදහස් වේ.'.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.**

13. 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියෙහි "දිසා අධිකරණයක්" යන යෙදුම වෙනුවට "අධිකරණයක්" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වගන්තිය සංශෝධනය කිරීම.**

14. ප්‍රධාන ප්‍රඥප්තියෙහි (ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් ඇතුළත් කරන ලද) 26අ වගන්තියෙහි "දිසා අධිකරණය" යන යෙදුම වෙනුවට "මහාධිකරණය" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.**

15. 1958 අංක 40 දරන පනතින් සහ 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 27 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(i) "දිසා අධිකරණයක්" සහ "දිසා අධිකරණයේ" යන යෙදුම් වෙනුවට පිළිවෙලින් "අධිකරණයක්" සහ "අධිකරණයේ" යන යෙදුම් ආදේශ කිරීමෙන් ; සහ

(ii) "දිසා විනිශ්චයකාරවරයා" යන යෙදුම වෙනුවට "මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා නැතහොත් මහෙස්ත්‍රාත්වරයා" යන යෙදුම ආදේශ කිරීමෙන්.

16. 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "දිසා අධිකරණයක්" යන යෙදුම වෙනුවට "අධිකරණයක්" යන යෙදුම ආදේශ කිරීමෙන් සහ "ඒ අධිකරණය" යන යෙදුම වෙනුවට "දිසා අධිකරණය" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ii) එහි පාර්ශ්ව සටහනෙහි "දිසා අධිකරණය" යන යෙදුම වෙනුවට "අධිකරණයක්" යන යෙදුම ආදේශ කිරීමෙන්.

17. 1958 අංක 40 දරන පනතින් සහ 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 29 වන වගන්තියෙහි "දිසා අධිකරණයක්" යන යෙදුම වෙනුවට "අධිකරණයක්" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියෙහි "අපරාධ නඩු විධාන සංග්‍රහයේ" යන යෙදුම වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 31 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ඉවත් කිරීම.

20. 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(i) "ආඥාවක් කරන මෙන් තමා විසින් තීරණය කරනු ලැබිය හැකි දිසා අධිකරණයකින්" යන වචන වෙනුවට "ආඥාවක් කරන මෙන් මහාධිකරණයෙන්" යන වචන ;

(ii) "ඒ දිසා අධිකරණය විසින් එම ඉල්ලීම" යන යෙදුම වෙනුවට "ඒ මහාධිකරණය විසින් එම ඉල්ලීම" යන යෙදුම ;

(iii) "ඒ දිසා අධිකරණය විසින් කරනු ලැබූ තීන්දු ප්‍රකාශයක් වූ" යන යෙදුම වෙනුවට "දිසා අධිකරණය විසින් කරනු ලැබූ තීන්දු ප්‍රකාශයක් වූ" යන යෙදුම

ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "දිසා අධිකරණයක්" යන යෙදුම වෙනුවට "මහාධිකරණය" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියෙහි "දිසා අධිකරණයක" යන යෙදුම වෙනුවට "මහාධිකරණයෙහි" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

21. 1958 අංක 40 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"විමර්ශන නිලධරයා ආදීන් ගේ විධානයන් ක්‍රියාත්මක කිරීම ඔනෑකමින් අතපසු කිරීම හෝ ඔහුට අවහිර කිරීම.

70. (අ) අල්ලස් කොමසාරිස්වරයා විසින් හෝ යම් විමර්ශනයක් විධාන කිරීමට සහ පැවැත්වීමට 3 වන වගන්තියෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ 3 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ දෙනු ලැබූ යම් විධානයක් ක්‍රියාත්මක කිරීම ඔනෑකමින් අතපසු කරන්නා වූ හෝ නොකර හරින්නා වූ; හෝ

(ආ) ඒ උපවගන්තිය යටතේ ප්‍රශ්න කරනු ලැබූ විට අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ; හෝ

(ඇ) ඒ උපවගන්තිය යටතේ වූ විධානයක් අනුව තමා විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයක අසත්‍ය ප්‍රකාශයක් කරන්නා වූ

තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයකට නොඅඩු සහ රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක මාස හයකට නොවැඩි කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

22. 1958 අංක 40 දරන පනතින් සහ 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"තොරතුරු සැපයීම පැහැර හැරීම.

71. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල හෝ යම් රහස්‍ය දිවුරුමක හෝ මීට පටහැනිව කුමක් සඳහන් වුව ද 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අල්ලස් කොමසාරිස්වරයා විසින් හෝ 34 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් හෝ දැන්වීමක් යවනු ලැබූ සෑම තැනැත්තකු ම ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන කාලය ඇතුළත ඒ දැන්වීමේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර, එසේ කිරීම ඔහු ඔනෑකමින් ම අතපසු කළහොත් හෝ නොකර හැරියහොත් ඔහු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට—

(අ) රුපියල් සියයකට නො අඩු සහ රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක මාස හයක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ; සහ

(ආ) දිවුරන ලද ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ඔහුට නියම කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයෙන් පසු වරද නොකඩවා කර ගෙන යනු ලැබූ සෑම දිනයක් සඳහා ම රුපියල් සියයක් නොඉක්මවන දඩයකට

ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

23. 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සාක්ෂිකරුවන්ට බාධා කිරීම.

73. (1) (අ) අල්ලස් ගැනීම සම්බන්ධයෙන් යම් නඩු කටයුත්තක දී යම් අධිකරණයකට හෝ පරීක්ෂණ කොමිසමකට නැතහොත් අධිකරණයක් ඉදිරියට හෝ පරීක්ෂණ කොමිසමක් ඉදිරියට හෝ කැඳවනු ලැබූ යම් සාක්ෂිකරුවකුට හෝ යම් විමර්ශනයක් පවත්වන අතර අල්ලස් කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තකුගේ ප්‍රකාශයක් වාර්තාගත කරනු ලැබුවේ ද ඒ තැනැත්තාට හෝ බාධා කරන්නා වූ, හෝ

(ආ) සාක්ෂි දීමෙන් වැළකී සිටීමට එවැනි යම් සාක්ෂිකරුවකු හෝ එවැනි යම් තැනැත්තකු පොළඹවන්නා වූ, හෝ

(ඇ) එවැනි යම් සාක්ෂිකරුවකු හෝ එවැනි යම් තැනැත්තකු සාක්ෂි දීම වැළැක්වීම පිණිස ඔහුගේ ශරීරයට, සිතට හෝ කීර්තියට හානි කරන බවට තර්ජනය කරන්නා වූ, හෝ

(ඈ) එවැනි යම් සාක්ෂිකරුවකු හෝ එවැනි යම් තැනැත්තකු හෝ සාක්ෂි දීමෙන් වැළැක්වීමට ඔහුගේ ශරීරයට, සිතට හෝ කීර්තියට හානි කරන්නා වූ, හෝ

(ඉ) එවැනි යම් සාක්ෂිකරුවකුට හෝ එවැනි යම් තැනැත්තකුට සාක්ෂි නොදීමට බල කරන්නා වූ

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වර යකු විසින් වරදකරු කරනු ලැබූ විට මාස දොළහක් නොඉක්මවන්නා වූ කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට යටත් විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වරදක් කර ඇති බවට හෝ කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට හෝ එවැනි වරදක් කර ඇතැයි හෝ කිරීමෙහි ලා සම්බන්ධ වී ඇතැයි සැක කරන බවට වූ චෝදනා වක් මත යම් තැනැත්තකු, තමා විසින් ම භාර වන්නේ නැතහොත් අත් අඩංගුවට ගෙන ඉදිරි පත් කරනු ලබන්නේ යම් අධිකරණයක් වෙත ද ඒ සෑම අධිකරණයක් විසින් ම, ඔහු ඇප පිට නිදහස් කිරීම සඳහා එම අධිකරණයට ඇති හේතු වාර්තාගත කිරීමෙන් පසුව ඔහු නිදහස් කරනු ලැබිය හැකි අසාමාන්‍ය අවස්ථාවල දී හැර, නඩු විභාගය අවසන් වන තෙක් ඔහු රිමාන්ඩ් භාර යෙහි තැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(i) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) අල්ලස් කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් හෝ අල්ලස් කොමසාරිස්වරයාගේ හෝ එසේ බලය දෙනු ලැබූ නිලධරයකුගේ ලිඛිත අනුමතය ඇතිව හෝ හැර මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක් කිසිදු මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් භාරගනු නොලැබිය යුතු ය."; තව ද

(ii) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "දිසා අධිකරණ යක" යන යෙදුම වෙනුවට "අධිකරණයක" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "දිසා අධිකරණ යක්" යන යෙදුම වෙනුවට "අධිකරණයක්" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්ති යෙහි 81 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "අපරාධ නඩු විධාන සංග්‍රහය" යන යෙදුම වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

27. 1958 අංක 40 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වගන්තියෙහි "අපරාධ නඩු විධාන සංග්‍රහයේ XXඅ. වන පරිච්ඡේදය" යන යෙදුම වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XIX වන පරිච්ඡේදය" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වගන්තිය සංශෝධනය කිරීම.

28. 85අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති ඇතුළත් කරනු ලබන අතරම, ඒවා පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 85ආ සහ 85ඇ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 85ආ සහ 85ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303(5) වන වගන්තියෙහි විධිවිධාන මේ පනතේ 29 වන වගන්තියෙහි විධිවිධාන අදාළ වන නැනැත්තන් කෙරෙහි අදාළ නොවිය යුතු බව.

85ආ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 (5) වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, අල්ලස් පිළිබඳව වරදකරු කරනු ලැබුවා වූ ද, ඒ වරදකරු කිරීම වෙනුවෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 (1) වන වගන්තිය යටතේ අත්හිටවූ සිර දඬුවමක් පනවන ලද නැනැත්තකු වන්නා වූ ද යම් නැනැත්තකු කෙරෙහි මේ පනතේ 29 වන වගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

අන්තර් කාලීන විධිවිධාන.

85ඇ. රුපියල් දෙසීයයක් නොඉක්මවන යම් මුදලක හෝ රුපියල් දෙසීයයක් නොඉක්මවන වටිනාකමක හෝ තුටු පඬුරක් අයැදීමේ, භාර ගැනීමේ හෝ පිරිනැමීමේ වරදක් සම්බන්ධයෙන් මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයෙහි මහාධිකරණයෙහි විනිශ්චයට භාජනව ඇති යම් නඩුවක්, මහෙස්ත්‍රාත් අධිකරණය වෙත මාරු කරනු ලැබිය යුතු යයි වරදෙහි ස්වභාවය සහ අවස්ථාගත වෙනත් කරුණු ගැන සැලකිලිමත් ව, මහාධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ නඩුව මහෙස්ත්‍රාත් අධිකරණයට භාර විය යුතු අතර, එය සංජානනය කිරීමට ද විභාග කිරීමට ද තීරණය කිරීමට නැත හොත් අවසන් කිරීමට ද අධිකරණ බලය, ඒ මහෙස්ත්‍රාත් අධිකරණයට තිබිය යුතු ය :

එසේ වුව ද මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයෙහි සාක්ෂි මෙහෙයවීම ආරම්භ කර තිබුණේ යම් නඩුවක ද ඒ නඩුව එකී මහාධිකරණය විසින් විභාග කර තීරණය කරනු ලැබිය යුතු ය.".

29. ප්‍රධාන ප්‍රඥප්තියෙහි (ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන පනතින් ඇතුළත් කරන ලද) 89අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 89අ වගන්තිය සංශෝධනය කිරීම.

(i) "රාජ්‍ය නිලධරයකු" යන යෙදුම වෙනුවට "රජයේ සේවකයකු" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ii) "කොළඹ දිසා අධිකරණයට" යන වචන වෙනුවට "කොළඹ පැවැත්වෙන මහාධිකරණයට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) එහි පාර්ශ්ව සටහනෙහි "රාජ්‍ය නිලධරයකු" යන යෙදුම වෙනුවට "රජයේ සේවකයකු" යන යෙදුම ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම.**

30. ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 11 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තියේ "උපලේඛනගත ආයතනය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

' "උපලේඛනගත ආයතනය" යන්නෙන් මේ පනතේ උපලේඛනයේ තත් කාලයෙහි නිශ්චිතව සඳහන් වන යම් මණ්ඩලයක්, ආයතනයක්, සංස්ථාවක් නැතහොත් වෙනත් මණ්ඩලයක් ද, මේ පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු යයි යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ සලකනු ලබන යම් මණ්ඩලයක්, ආයතනයක්, සංස්ථාවක් නැතහොත් වෙනත් මණ්ඩලයක් ද අදහස් වන අතර—

(අ) එකී යම් මණ්ඩලයක්, ආයතනයක්, සංස්ථාවක් නැතහොත් වෙනත් මණ්ඩලයක් විසින්, හෝ

(ආ) එකී මණ්ඩල, ආයතන, සංස්ථා නැතහොත් වෙනත් මණ්ඩල එකකට වැඩි ගණනක් විසින් සමස්තයක් වශයෙන්

කොටස්වලින් සියයට පණස් එකකට නොඅඩු ප්‍රමාණයක් දරනු ලබන්නා වූ පොදු හෝ පෞද්ගලික යම් සමාගමක් හෝ වෙනත් මණ්ඩලයක් ද එයට ඇතුළත් වේ.'.